රහස්‍ය තොරතුරු. යැයි වසන් කිරීමට තැත් කළත් තමාට අදාළ තොරතුරු ලබාගත් පුරවැසියෙක්...

තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය - 13-11-2019
කොමිසමේ නියෝගය ලබා දුන් දිනය - 21-01-2020
අභියාචනා අංකය - RTIC Appeal//1891/20
පොදු අධිකාරිය - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අදාළ වගන්ති - 5 (1) (ස) සහ 29 වගන්ති
තීන්දුව - අභියාචකගේ රැකියාවට අදාළ ඇමිණුම් සහිත ලියවිලි පොදු අධිකාරිය විසින් අභියාචක වෙත මුදා හරිය යුතු ය.

අයාචිත තොරතුරු
පුරවැසියෙක් විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත තොරතුරු ඉල්ලීමේ අයදුම්පත්‍රයක් යොමු කරමින් ඉල්ලා සිටියේ, පැවැත්වුණු 1017 වන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීමේදී අයදුම්කරු සම්බන්ධව කොමිසම වෙත ඉදිරිපත් වූ සියලු ලියවිලි සහ සවිස්තර වාර්තාවල පිටපතක් සහ එම සැසි වාරයට අදාළව 1018 වන සැසිවාරයේදී සම්මත කරගත් තීරණයට අදාළ වාර්තාවත් ලබා දෙන ලෙස ය.

පොදු අධිකාරියේ ප්‍රතිචාරය
ඔහුගේ මෙම ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් තොරතුරු නිලධාරියා විසින් 12.12.2019 දරන පිළිතුරු ලිපිය යොමු කරමින් පවසා සිටියේ අදාළ තොරතුරු ඒ සමග අමුණා එවා ඇති බවයි. එබැවින් අදාළ සවිස්තර වාර්තාව සහ සම්මත කරගත් තීරණයට අදාළ 05.09.2019 දිනැති වාර්තාවක් අයදුම්කරුට හිමි විය. නමුත් අයදුම්කරු නම් කළ නිලධාරියාට අභියාචනා කරමින් පවසා සිටියේ අදාළ සවිස්තර වාර්තාවට සබැඳි ඇමිණුම් ඇති බවත් තොරතුරු නිලධාරියා විසින් ඒවා ලබා දී නොමැති බවත් ය. මෙහිදී අයදුම්කරු පවසා සිටියේ එම ඇමිණුම් ලබා නොදී සිටීමට හේතුවක්ද තොරතුරු නිලධාරියා විසින් සඳහන් කර නොමැති බවයි.

මෙහිදී තොරතුරු නිලධාරියා අයදුම්කරුට නැවත ප්‍රතිචාර දක්වමින් දන්වා සිටියේ සවිස්තර වාර්තාව, රැස්වීම් තීන්දුව පිලිබඳ වාර්තාව, ආයතනික සංග්‍රහයේ 8 වන පරිච්ඡේදයෙහි ඇති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ උසස් අධ්‍යාපන ආයතන වලට අදාළ වගන්ති සහ 885, 935 යන රැස්වීම් වාර වලදී නැගෙනහිර විශ්ව විද්‍යාලයේ අධ්‍යන කාර්යය මණ්ඩල සාමාජිකයෙක්ට, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් රැකියාවල නියැලිය හැකිද යන්න පිළිබඳව විස්තර කරමින් ගත් තීන්දුවල වාර්තාද ඔහුට ලබාදුන් තොරතුරු ගොනුවේ පවතින බව ය. ඊට අමතරව ඔහු විසින් සඳහන් කර තිබුනේ තොරතුරු දැනගැනීමේ අයිතිය පනතේ 5 (1) වගන්තියට යටත්ව යම් යම් තොරතුරු ලබා දීමෙන් වැළකීමට සිදුවූ බවයි.

කොමිසමේ විභාගය
මෙම ප්‍රතිචාරයත් සමග අයදුම්කරු විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය කොමිසමට 27.12.2019 දින අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව ඔහු විසින් 06.01.2020 දින විද්‍යුත් තැපෑල මගින්, ශ්‍රේෂ්ඨාධිකරණයේ ඔහුගේ නීතිඥ වෘත්තියේ කටයුතු කිරීම තහනම් කිරීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර ඇති බැවින් එය විභාගයට ගැනීමේදී ඔහුට සිදුවූ අසාධාරණය ඔප්පු කිරීමට, පොදු අධිකාරිය විසින් ලබා දීමට ප්‍රතික්ෂේප කරන තොරතුර අත්‍යවශ්‍ය බව සහ ඔහු බාරගත් නඩු කටයුතු කිහිපයක් ම යාපනය උසාවි වල විභාග වෙමින් පවතින නිසා ඒවාට සාධාරණයක් ඉෂ්ට කිරීමට ඔහු නීතිඥ වෘත්තියේ කටයුතු කිරීම අත්‍යවශ්‍යය යන කරුණු මත කඩිනම් විභාගයක් ඉල්ලා සිටින ලදී. කොමිසම තීරණය කළේ මෙම ගැටලුවේ ඇති මහජන සුභසිද්ධිය යන කාරණය සලකා, එහි විභාගයට මූලිකත්වයක් දිය යුතු බව ය. කොමිසම ඉදිරියේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව පවසා සිටියේ අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානයෙහි අවසරය පැතුවද ඔවුන් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බවයි.

කොමිසමේ තීන්දුව
කොමිසමේ අදහස වූයේ තොරතුරක් රහස්‍ය වීමට නම් එය පොදු අධිකාරියට ලබා දෙන අවස්ථාවේදීම රහස්‍ය විය යුතු බවයි. එසේ නොමැතිව පොදු අධිකාරිය විසින් පසුව එය රහස්‍ය තොරතුරක් ලෙස අර්ථ දැක්වීම ප්‍රමාණවත් නොවන බවයි. එබැවින්, ලබා දීමට ප්‍රතික්ෂේප කළ තොරතුරු ඇතුලත් ඇමිණුම් පරික්ෂා කළ කොමිසමට වැටහී ගියේ ඒවා පොදු අධිකාරියට ලබා දෙන අවස්ථාවේදී තුන්වන පාර්ශවය විසින් රහස්‍ය තොරතුරක් ලෙස සඳහන් කර ලබා දී නොමැති බව ය. එසේම තොරතුරු නිලධාරියා විසින් තුන්වන පාර්ශවයෙන් නොවිමසා ම ඒවා රහස්‍ය තොරතුරු ලෙස අර්ථ දක්වා ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. තවදුරටත් කොමිසම පැහැදිලි කළේ එම ඇමිණුම් වල අඩංගු වන්නේ අයදුම්කරුගේ රැකියාව සම්බන්ධ කරුණු නිසාත් එම තොරතුරු කිසිසේත් ම 5 (1) (ස) වගන්තිය යටතේ රහස්‍ය තොරතුරු ගණයට ඇතුලත් නොවන බවයි. අවසානයේ කොමිසම විසින් අදාළ තොරතුරු ඇතුලත් ඇමිණුම් පොදු අධිකාරිය විසින් අයදුම්කරුට ලබා දිය යුතු ලෙසට තීරණය කරන ලදී.

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
නො.5/1, එලිබෑන්ක් පාර,
කොළඹ 05.
දුරකථන: (94) 11 4369781, 4369782, 4369783
ෆැක්ස් : (94) 11 2 501707
ඊමේල් : tisl@tisrilanka.org

ඔබට මෙම පුවත් හසුන අවශ්‍ය නොවේනම් කරුණාකර පහත ලිපිනයට හරවා එවන්න

වෙත -

පළමු වෙළුම - සිව්වන ප්‍රකාශය
"හඬක් හැනි ප්‍රජාවට හඬක් වෙමු"
2020 සැප්තැම්බර් / ඔක්තෝබර්

මෙම පුවත් හසුන සැකසීමේ සහ තැපැල් කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද භාවිතා කරමින් සිදු කර ඇත.

තොරතුරුවලට විශ්වීය ප්‍රවේශයේ ජාත්‍යන්තර දිනය....

තොරතුරු වලට ප්‍රවේශවීමේ දිනයක් ඇතිකිරීමේ ක්‍රියාවලිය ප්‍රථම වරට ආරම්භ කරන ලද්දේ 2011 වර්ෂයේ පැවැත්වුණු තොරතුරු ප්‍රවේශය සඳහා වූ පෑන්-ඇෆ්රිකන් සමුළුවේදී ය. කෙසේ වෙතත්, තොරතුරුවලට විශ්වීය ප්‍රවේශයේ ජාත්‍යන්තර දිනය ලෙස සැප්තැම්බර් 28 දිනය යුනෙස්කෝ සංවිධානය විසින් 2015 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී නම් කෙරුණේ 38/ C 57 යෝජනා සම්මතය ඔස්සේ යමින්, තොරතුරු සෙවීමේ සහ ලබා ගැනීමේ අයිතිය, ප්‍රකාශනයේ නිදහසේ මූලිකාංගයක් සහ තිරසාර සංවර්ධනයට රුකුලක් ලෙසින් හඳුනා ගැනීමේ වැදගත්කම විදහාපාමිනි. විශේෂයෙන්ම 2012 වසරේ පටන්, තොරතුරුවල විනිවිදභාවය පවත්වා ගැනීම වෙනුවෙන් කටයුතු කළ අප්‍රිකානු සිවිල් සමාජීය ක්‍රියාකාරීන් විසින් යුනෙස්කෝ සංවිධානයට කරන ලද බලපෑම, මේ යෝජනා සම්මතය සම්මත කරගැනීම වෙනුවෙන් ශක්තිමත් පදනමක් විය. 2016 වර්ෂයේ පටන් යුනෙස්කෝ සංවිධානය විසින් මෙම දිනය සමරන ලද අතර එහිදී තොරතුරු වලට ප්‍රවේශය ලබා දීම, 2030 න්‍යාය පත්‍රය තුල ඇති තිරසාර සංවර්ධන ඉලක්ක අතර ඉතා වැදගත් ස්ථානයක පවතින බව සැලකිල්ලට ගන්නා ලදී.

අනතුරුව, 2019 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධානය ලෝකයේ රටවල් 20 පමණ සමග තිරසාර සංවර්ධනයෙහි ලා තොරතුරු වලට ප්‍රවේශ වීමේ අයිතියෙහි ඇති සුභවාදී බලපෑම පිලිබඳ සාකච්ඡා මාලාවක් සංවිධානය කළහ. විශේෂයෙන් ම තිරසාර සංවර්ධනය උදෙසා රටවල් විසින් ව්‍යවස්ථාපිත හා ප්‍රතිපත්තිමය වශයෙන්, තොරතුරු වලට මහජනයාගේ ප්‍රවේශවීම තහවුරු කරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිලිබඳ පරික්ෂා කරන ලදී. අවසානයේ දී, 2019 වර්ෂයේ ඔක්තෝම්බර් 15 වන දින එක්සත් ජාතීන්ගේ සංගමයේ 74 වන සමුළුවේදී, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් තොරතුරු වලට විශ්වීය ප්‍රවේශයේ ජාත්‍යන්තර දිනය ලෙස සැප්තැම්බර් 28 ප්‍රකාශයට පත් කරන ලදී. ලයිබීරියාවේ එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිතවරයාගේ යෝජනාව මත ඇතිකරගත් එකඟතාව මත මෙය සම්මත කරගන්නා ලදී. 2019 වර්ෂයේදී මෙම දිනය ශ්‍රී ලංකාව තුල උත්කර්ශවත් අන්දමින් සමරනු ලැබූයේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ දීපව්‍යාප්තව සිදුකරන ලද සමාලෝචනයකින් ලද වාර්තාව එළිදැක්වීම සහ පුරවැසියන්ගේ තොරතුරු අයිතිය වෙනුවෙන් කටයුතු කළ පුද්ගලයින් සොයා ,පුරවැසි අභිමන්, සම්මාන උළෙලේ දී සම්මාන ප්‍රදානය කිරීමත් සමගින් ය.

දෙවන පිටුවට

පළමු පිටුවෙන්

තොරතුරුවලට විශ්වීය ප්‍රවේශයේ ජාත්‍යන්තර දිනය...

මෙවර ඔස්ට්‍රේලියාව, නවසීලන්තය, දකුණු අප්‍රිකාව, ජැමෙයිකාව, පකිස්ථානය, පිලිපීනය, කැනඩාව සහ ආර්මේනියාව ඇතුළු රටවල් ගණනාවක්ම තොරතුරු වලට විශ්වීය ප්‍රවේශයේ ජාත්‍යන්තර දිනය කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද විවිධ සැමරුම් සිදු කරන්නට විය. විශේෂයෙන් ම යුනෙස්කෝ සංවිධානය විසින් ජාත්‍යන්තර වශයෙන්, අන්තර්ජාලය ඔස්සේ සම්මන්ත්‍රණ මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ ද මෙම වර්ෂයේ දී ද වැඩසටහන් කිහිපයක් ම ක්‍රියාත්මක වුණි. ඒ අතරින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කරන ලදී.

ඊට අමතරව, මාතර සහ වව්නියාව කාර්යාල වල මැදිහත් වීමෙන් එම ආශ්‍රිත නගර වල දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන අතරතුර, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් කොළඹ කාර්යාලය මගින් කොළඹ කොටුව දුම්රිය ස්ථානයේදී මහජනතාව දැනුවත් කරන ලදී. එමෙන් ම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, සුභාරති සංවාද මණ්ඩපය, වැඩසටහන ඔස්සේ සමස්තයක් ලෙස මෙම දිනයේ ඇති වැදගත් කම ඇතුළු තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ ශ්‍රාවකයින්ට අවබෝධයක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, තොරතුරුවලට විශ්වීය ප්‍රවේශයේ ජාත්‍යන්තර දිනය තවත් එක් කැලැන්ඩර දිනයක් නොකර, පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම උදෙසා ලද මහඟු අවස්ථාව සිහි කරමින්, එයින් ප්‍රයෝජනය ගෙන තමන්ට අවශ්‍ය තොරතුරු පොදු අධිකාරීන්ගෙන් ලබා ගෙන තම තමන්ට ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට ලෝකවාසි ජනතාව යුහුසුළුව කටයුතු කළ යුතු වේ.

තොරතුරුවලට විශ්වීය ප්‍රවේශයේ ජාත්‍යන්තර දිනය ලෙස සැප්තැම්බර් 28 දිනය යුනෙස්කෝ සංවිධානය විසින් 2015 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී නම් කෙරුණේ 38/ C57 යෝජනා සම්මතය ඔස්සේ යමින්, තොරතුරු සෙවීමේ සහ ලබා ගැනීමේ අයිතිය, ප්‍රකාශනයේ නිදහසේ මූලිකාංගයක් සහ තිරසාර සංවර්ධනයට රුකුලක් ලෙසින් හඳුනා ගැනීමේ වැදගත්කම විදහාපාමිනි.

2019 වර්ෂයේදී මෙම දිනය ශ්‍රී ලංකාව තුල උත්කර්ශවත් අන්දමින් සමරනු ලැබූයේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිලිබඳ දීපව්‍යාප්තව සිදුකරන ලද සමාලෝචනයකින් ලද වාර්තාව එළිදැක්වීම සහ පුරවැසියන්ගේ තොරතුරු අයිතිය වෙනුවෙන් කටයුතු කළ පුද්ගලයින් සොයා ,පුරවැසි අභිමන්, සම්මාන උළෙලේ දී සම්මාන ප්‍රදානය කිරීමත් සමගින් ය.

තොරතුරු අයිතියෙන් සුභසෙත ලැබූවෝ.....

වව්නියාව මරවන්කුලම් ගම්මානයේ වැසියෝ 48 දෙනෙකු පමණ වකුගඩු රෝගාබාධ වලින් දීර්ඝකාලීනව පීඩා විඳිමින් සිටියහ. මේ හේතුවෙන් ඔවුන් විසින් වව්නියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැන්වීමක් කරමින් ඉල්ලා සිටියේ පානීය ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රයක් එම ප්‍රදේශයට ලබා දෙන ලෙස ය. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ මැයි මාසයේදී ජල පිරිපහදු යන්ත්‍රයක් එම ප්‍රදේශයේ ස්ථාපිත කරන ලදී. කෙසේ වෙතත් එම යන්ත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක වුයේ දින 10ක් පමණි. පසුව එය නිතර නිතර අලුත්වැඩියා කිරීමට සිදුවිය. මේ අවස්ථාවේදී මරවන්කුලම් ගම් වැසියෙක් වූ ශෝකලිංගම් මහතා විසින් වව්නියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මේ පිළිබඳව පැමිණිලි කරන ලදී. එහෙත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එම පැමිණිල්ලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළේ ය. එහෙයින්, ශෝකලිංගම් මහතා විසින් ජල පිරිපහදු යන්ත්‍රයේ තත්ත්වය, ගුණාත්මක බව සහ ඒ වෙනුවෙන් වැය කළ මුදල ආදිය පිළිබඳව විමසා, තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත්‍රයක් වව්නියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අතරතුර ශෝකලිංගම් මහතා විසින් එම ජල පිරිපහදු යන්ත්‍ර අලෙවි කරන සමාගමකට ගොස් එම යන්ත්‍රයේ වර්ගය සහ තත්ත්වය පිළිබඳව විමසීමක් කළ විට ඔහුට දැනගන්නට ලැබුනේ ගමෙහි සවි කර ඇති යන්ත්‍රය බාල වර්ගයේ එකක් බව ය. මේ තොරතුරත් සමග තමාගේ තොරතුරු ඉල්ලීමට යහපත් විසඳුමක් ලැබේවීයි යන විස්වාසය ශෝකලිංගම් මහතාට ඇතිවිය. කෙසේ වෙතත් යන්ත්‍රයේ තිබූ අඩුපාඩු නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොරතුරු නිලධාරීන් විසින් අදාල නිවැරදි තොරතුරු ලබා දීම වුවමනාවෙන් ම මගහරින ලද අතර අනවශ්‍ය ලෙස කාලය ගනිමින් විරින් විට සුළු තොරතුරු කිහිපයක් පමණක් ලබා දෙමින් ශෝකලිංගම් මහතාව අපහසුවට පත් කරන ලදී. එහෙත් තොරතුරු නිලධාරියාගේ මේ ක්‍රියාකලාපය ශෝකලිංගම් මහතා තුල තිබූ, තොරතුරු දැනගැනීමේ අයිතියෙන් ඔහුට සහනයක් ලැබේවීයි යන විශ්වාසය සහ බලාපොරොත්තුව කඩකිරීමට සමත් නොවී ය. අනතුරුව ඔහු විසින් නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී. අවසානයේ, වව්නියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ මාර්තු මස 15 වන දින ජල පිරිපහදු යන්ත්‍රය අලුත්වැඩියා කරන ලදී. ශෝකලිංගම් මහතාගේ තොරතුරු අයදුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වන විට මරවන්කුලම් ප්‍රදේශයේ ජනතාවට පිරිසිදු පානීය ජලය පානය කිරීමේ හැකියාව උදා වී ඇත.

2018 වර්ෂයේදී පුරවැසියෙක් විසින් තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත්‍රයක් පොදු අධිකාරියට යොමු කළේ, පැල්මඩුල්ල සිට නෝනාගම දක්වා අලුතින් ඉදිවන මාර්ගයේ ඉදිකිරීම් කටයුතු පිලිබඳ තොරතුරු දැනගැනීම සඳහා යි. එම මාර්ග ඉදිකිරීමේ බැලූ බැල්මට ම යම් යම් ගැටළු තිබුණි. සමහර අත්‍යවශ්‍ය කාණු මාර්ග ඉදිකිරීම සිදුවී නොතිබුණි. එබැවින් වර්ෂා කාලයට එම ප්‍රදේශයේ මාර්ගාසන්න නිවාස ජලයෙන් යටවීම නිසා ජනතාව දැඩි අපහසුතාවයට පත් විය. මෙම පුරවැසියා විසින් තම තොරතුරු දැනගැනීමේ අයැදුම්පත්‍රයෙන් විමසා සිටියේ මෙම තත්ත්වයට පිළිබඳව, මාර්ගයේ ඉදිකිරීම් කටයුතු දිනෙන් දින කල් යාමට හේතු සහ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නිමා වන්නේ කෙදිනද යන්න පිළිබඳව ය. ඔහුගේ මෙම තොරතුරු ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කාණු පද්ධතිය නිසි ලෙස සකස් කොට කඩිනමින් මාර්ගයේ ඉදිකිරීම් නිසි ලෙස සිදුකර අවසන් කරන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජන්සගම ප්‍රදේශයේ කාලාන්තරයක් තිස්සේ නීතිවිරෝධී වැලි ජාවාරම් සිදුවෙමින් පැවතුණි. මේ වැලි ගොඩදැමීමේ බලපත්‍ර පිළිබඳව තොරතුරු විමසමින් පුරවැසියෙකු විසින් අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලදී. මේ ගැටලුව පිළිබඳව පසුගිය වසරේ අදාල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුණු නාගරික ශාලා රැස්වීමේදී සාකච්චාවට බඳුන් විය. එහිදී අම්බලන්තොට, අදාල ප්‍රදේශයේ වැලි ගොඩ දැමීම සම්බන්ධයෙන් ගැටළුවක් ඇති බව එම නිලධාරීන් විසින් පිළිගන්නා ලදී. මින් පසුව නිසි ස්ථානීය පරීක්ෂාවකින් සහ විමර්ශනයකින් තොරව වැලි ගොඩදැමීමේ බලපත්‍ර නිකුත් කිරීමෙන් වැළකීමට එම නිලධාරීන් එකඟ වන ලදී. ඉන් අනතුරුව අද වන විට එම ප්‍රදේශයේ තත්වය ඉතාමත් සාමකාමී වන අතර අදාල බලයලත් ආයතන විසින් වැලි ගොඩදැමීමේ බලපත්‍ර නිකුත් කිරීමේදී නිසි ක්‍රියාපිළිවෙත අනුගමනය කරමින් තම රාජකාරිය නිසි ලෙස ක්‍රියාත්මක කරන බව ප්‍රදේශ වාසීන්ගේ අදහසයි.